**අයදුම් කළ හැක්කේ මාර්ගගතව පමණි.** අයදුම්පත්‍ර කැඳවන අවසන් දිනය වන 2023.11.20 දින මධ්‍යම රාත්‍රී 12.00 ට පෙර මාර්ගගත අයදුම්පත්‍රයේ කොටස් දෙකම සම්පූර්ණ කල යුතුය.

අයදුම්පත්‍රය **ඉංග්‍රීසි මාධ්‍යයෙන්** සම්පූර්ණ කළ යුතුය.

මාර්ගගත අයදුම්පත්‍රය කොටස් 2 කින් සමන්විත වේ. එම කොටස් 2 කට අදාළව තොරතුරු ඇතුලත් කිරීම පිළිබඳව උපදෙස් පහත පරිදි වේ.

අයදුම්පත්‍රයේ පළමු කොටස (PART I) සම්පූර්ණ කිරීම සම්බන්ධ උපදෙස්

- මෙම වෙබ් පිටුවෙහි "APPLY NOW" ලෙස සඳහන් තීරය ක්ලික් කිරීමෙන් අයදුම්පත්‍රයෙහි පළමු කොටසට (PART I වෙත) පිවිසිය හැක.
- මෙම කොටසෙහි ඔබගේ **පෞද්ගලික තොරතුරු, පදිංචිය පිළිබඳ තොරතුරු සහ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ තොරතුරු** ඇතුලත් කල යුතුය.
- ඉල්ලුම් කරන විෂයට අදාළ භාෂා මාධ්‍යය අනුව විභාගයට ඉදිරිපත් විය යුතු භාෂා මාධ්‍යය "MEDIUM" යටතේ තේරිය යුතුය.
- අ.පො.ස (සා.පෙළ) ප්‍රතිඵල ඇතුළත් කිරීමේදී ඔබ යම් විෂයකට එක් වරකට වඩා ඉදිරිපත් වී සිට ඇත්නම් එම විෂයයට ඉහළම සමාර්ථය ලබාගත් වාරයේ ප්‍රතිඵලය පමණක් ඇතුලත් කිරීම ප්‍රමාණවත් වේ. පෙනී සිටි වාරය "ATTEMPT" තීරුවේ සටහන් කර අදාළ විෂයයට විභාගයට ඉදිරිපත් වූ වර්ෂය, විභාග අංකය සහ ප්‍රතිඵලය සටහන් කිරීම ප්‍රමාණවත්වේ.
- අයදුම්පත්‍රය පිරවීමේදී "DIVISIONAL SECRETARIATE" යටතේ ඔබ පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තේරිය යුතු අතර "GRAMA NILADHARI DIVISION" යටතේ ඔබ පදිංචි ග්‍රාම නිලධාරී කොට්ඨාෂය නිවැරදිව සටහන් කල යුතුය.
- මාර්ගගත අයදුම්පත්‍රෙය් PART I හි අදාළ තොරතුරු ඇතුලත් කිරීමෙන් අනතුරුව "SUBMIT PART [I]" ක්ලික් කිරීමෙන් තොරතුරු ඇතුලත් කරන ලද අයදුම්පත්‍රය බාගත කරගත හැක.

අයදුම්පත්‍රයේ දෙවන කොටස (PART II) සම්පූර්ණ කිරීම පිළිබඳ උපදෙස්

- මාර්ගගත අයදුම්පත්‍රයේ පළමු කොටස(PART I) සම්පූර්ණ කිරීමෙන් අයදුම්පත්‍රයේ PDF පිටපත බාගත කරගත හැක. එම පිටපත මුද්‍රණය කරගත හැකි අතර එහි දෙවන පිටුවෙහි ඔබගේ අත්සන යොදා එය සහතික කරගත යුතුය. (අත්සන සහතික කිරීම පිළිබඳ උපදෙස් පුවත්පත් දැන්වීමෙහි සඳහන් කර ඇත.)
- මාර්ගගත අයදුම්පත්‍රයේ දෙවන කොටසෙහි (PART II) විභාග ගාස්තු ගෙවීම පිළිබඳව සහ ලියාපදිංචි තැපැලෙන් අදාළ අයදුම්පත්‍රය යොමු කිරීම පිළිබඳ තොරතුරු සටහන් කල යුතුය. ඒ පිළිබඳව පහතින් ලබාදී ඇති **උපදෙස් හොඳින් කියවා** අදාළ තොරතුරු මාර්ගගත අයදුම්පත්‍රයෙහි ඇතුලත් කල යුතුය.
- විභාග ගාස්තු රු.600 /= කි. මෙම විභාග ගාස්තුව ආදායම් ශීර්ෂ අංක **2003-02-13** ට මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන ලේකම් නමින් මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබාගන්නා නිල්පැහැ ලදුපත, පෙර බාගතකර මුද්‍රණය කරගන්නා ලද අයදුම්පත්‍රයේ දෙවන පිටුවෙහි නියමිත තීරුවේ ඇලවිය යුතුය. **විභාග ගාස්තුව ගෙවන ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දිනය, ලදුපත් අංකය** මාර්ගගත අයදුම්පත්‍රයේ දෙවන කොටසට (PART II) ඇතුලත් කල යුතු බැවින් **එම තොරතුරු පැහැදිලිව සටහන් කර තබාගැනීම හෝ එම ලදුපතේ තොරතුරු පැහැදිලිව පෙනෙන පරිදි ලබාගත් ඡායාපිටපතක් හෝ ස්කෑන් කරන ලද පිටපතක් තබා ගැනීම වඩාත් සුදුසු වේ.**

- ඉහත උපදෙස් පරිදි සකස් කරන ලද අයදුම්පත්‍රය අයදුම්පත් කැඳවන අවසන් දිනය වන 2023.11.20 දිනට පෙර "**ලේකම්, මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් සභා සංකීර්ණය, පල්ලේකැලේ**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කල යුතුය. ලියාපදිංචි තැපෑලෙන් අයදුම්පත යොමු කිරීමෙන් අනතුරුව ඔබට තැපැල් කාර්යාලයෙන් ලබාදෙන කුවිතාන්සියේ සටහන් ලියාපදිංචි **තැපැල් අංකය, තැපැල් කාර්යාලයේ නම සහ කුවිතාන්සියේ දින මුද්‍රවා තබා ඇති දිනය** මාර්ගගත අයදුම්පත්‍රයේ දෙවන කොටසෙහි නිවැරදිව සටහන් කල යුතුය.
- මෙම වෙබ් පිටුවටම පිවිස "APPLICANTS LOGIN" අයිකනය මත ක්ලික් කිරීමෙන් මාර්ගගත අයදුම්පත්‍රෙයහි දෙවන කොටසට පිවිසීමට අදාළ LOGIN පිටුවට පිවිසිය හැක. එහි USER ID යටතේ ඔබ බාගත කරගන්නා ලද අයදුම්පත්‍රයේ සටහන් REFERENCE NUMBER අංකයත්, PASSWORD යටතේ එහි සඳහන් මුරපදයත් ඇතුලත් කිරීමෙන් දෙවන කොටසට පිවිසය හැක.
- එහි PAYMENT DETAILS යටතේ විභාග ගාස්තු ගෙවීම පිළිබඳ තොරතුරුද, POSTAL DETAILS යටතේ ලියාපදිංචි තැපෑලෙන් අයදුම්පත්‍රය යොමු කිරීම පිළිබඳ තොරතුරුද ඇතුලත් කල යුතුය. එම තොරතුරු නිවැරදිව ඇතුලත් කිරීමෙන් පසුව SUBMIT PART [II] අයිකනය ක්ලික් කිරීමෙන් මාර්ගගත අයදුම් කිරීමේ ක්‍රියාවලිය අවසන් කල හැක. නිවැරදිව අයදුම්පත ඉදිරිපත් කල පසු මාර්ගගත පද්ධතිය මඟින් තහවුරුවක් ලබාදෙනු ඇත.
- මාර්ගගත අයදුම් කිරීමේ දෙවන කොටස සම්පූර්ණ කිරීම අයදුම්පත්‍ර කැඳවන අවසන් දිනය වන 2023.11.20 දින මධ්‍යම රාත්‍රී 12.00 ට පෙර සිදු කල යුතු අතර ඉන් පසු අදාළ තොරතුරු ඇතුලත් කිරීමට අවස්ථාව ලබා දෙනු නොලැබේ.